# බටහිර විද්‍යාව හා රෙපරමාදු ආගම

දුරේක්ෂයෙන් අහස දෙස බැලූ ගැලීලියෝ විද්වතා දුටුවේ චන්ද්‍රයන් හෝ චන්ද්‍රිකා සහිත බ්‍රහස්පතී පමණක් නොවේ. ඔහුට සූර්ය ලප ගමන් කරනු ද නිරීක්ෂණය කිරීමට හැකිවිය. සූර්ය ලප ගමන් කිරීම යනුවෙන් අදහස් කෙරෙන්නේ ඒවා සූර්යාගේ අක්ෂය වටා භ්‍රමණය වන්නේ ය යන්න ය. මින් කියැවෙනුයේ සූර්යයා ද තම අක්ෂය වටා භ්‍රමණය වන බව ය. ආකාශ වස්තු සැහැල්ලු ද්‍රව්‍යයකින් සෑදුණු, ඒ නිසා පෘථිවි පෘෂ්ඨය තම ස්වාභාවික පිහිටුම නොවූ, එහෙත් පෘථිවිය වටා වෘත්තාකාර මූලික චලිතයෙහි යෙදුණු වස්තු බව ඇරිස්ටෝටලීය ගතිකයෙහි ද කතෝලික චින්තනයෙහි ද ඉගැන්විණි. ගැලීලියෝ විද්වතා මේ ප්‍රවාදය බැහැර කෙළේ ය. ඔහුට අනුව ආකාශ වස්තු ද, පෘථිවි වස්තු වැනි විය. ඒවා ද තම අක්ෂ වටා භ්‍රමණය වෙයි. ඒවා වටා චන්ද්‍රිකා පරිභ්‍රමණ චලිතයෙහි යෙදෙයි. මෙලෙස ආකාශ වස්තු හා පෘථිවි වස්තු අතර වෙනසක් නැතැයි කියා සිටිය ද, ආකාශ වස්තු පොළොවට කඩා නොවැටෙන්නේ ඇයි දැයි තේරුම් කර දීමට ගැලීලියෝ පඬිවරයාට නොහැකි විය. ආකාශ වස්තු හා පෘථිවි වස්තු අතර වෙනසක් නොමැති බව ප්‍රවාදයකට අනුව සාර්ථක ව පෙන්වීමට හැකි වූයේ ගුරුත්වාකර්ෂණ ප්‍රවාදය නිර්මාණය කළ අයිසැක් නිව්ටන් විද්වතාණන්ට ය. එක් අතෙකින් ගත්කල ගැලීලියෝ පඬිවරයා නිව්ටන් පඬිවරයාට අවශ්‍ය පසු බිම සකස් කර දුන්නේ යැයි කිව හැකි ය.

තම දුරේක්ෂය මගින් එකල විසූවන්ගේ කිසිදු සැකයකට භාජනය නොවන අයුරින් ආකාශ වස්තු හා පෘථිවි වස්තු අතර වෙනසක් නැතැයි තහවුරු කිරීමට ගැලීලියෝ පඬිවරයා සමත් වී යැයි කිසිවකු සිතන්නට ඉඩ ඇත. එහෙත් එය එසේ නොවේ. ෆෙයරාබන්ඩ් මහතා තම විධික්‍රමයට එරෙහිව (අගේන්ස්ට් මෙතඩ්) නම් කෘතියෙහි පෙන්වා දෙන ආකාරයට දුරේක්ෂය පිළිබඳ විවිධ ප්‍රශ්න එකල විසූවන්ට විය. දුරේක්ෂය එකල යුරෝපීයයනට නව භාණ්ඩයක් විය. එයින් දර්ශනය වන්නේ කුමක් ද යන්න පිළිබඳ විවිධ අර්ථකථන විය. දුරේක්ෂයෙන් නිරීක්ෂණය වනුයේ කුමක් ද යන්න එදා බොහෝ දෙනා නැගූ ප්‍රශ්නයක් විය. ටයිකෝ බ්‍රාහේ විද්වතා තම නිරීක්ෂණ කර තිබුනේ පියවි ඇසෙන් ආකාශ වස්තු දෙස බැලීමෙන් ය.

ඉහත සඳහන් සියළු දුර්වලකම් තිබියදීත් ගැලීලියෝ පඬිවරයා බටහිර නූතනත්වය බිහි කිරීම සඳහා ඉතා වැදගත් කාර්යයක් ඉටු කෙළේ ය. ඔහු ඉපදුණේ ෂේක්ස්පියර් නම් ඉංගිරිසි මහා කවියා උපන් වසරෙහි ය. මේ දෙදෙනා ම රෙපරමාදු ප්‍රතිසංස්කරණය හා සම්බන්ධ ක්‍රියාවලිය දුටුවෝ ය. ගැලීලියෝ පඬිවරයා එකල ශාස්ත්‍රීය අංශයෙහි මෙන් ම දේශපාලනයෙහි ද නිල බස වූ ලතින් වෙනුවට බොහෝ අවස්ථාවල දී ඉතාලි බස යොදා ගත්තේ ය. ෂේක්ස්පියර් පඬිවරයා බොහෝ දෙනා දන්නා පරිදි ලතින් බසින් නොව ඉංගිරිසියෙන් ලිවී ය. ජාතික භාෂාවන්ට එසේ එදා තැනක් දීමට කටයුතු කිරීම ම පෙරළිකාර සිද්ධියක් විය. ආගමික වශයෙන් පාප්වහන්සේගේ ආධිපත්‍යයට අභියෝග කෙරුණු අතර දේශපාලන වශයෙන් රෝම අධිරාජ්‍යයට විරුද්ධව නිදහස් සටන් මතුවිය. යුරෝපයේ භාවිතා වූ විවිධ භාෂා අතරින් අවසානයේ දී ඉංගිරිසිය ජය ගත්තේ දේශපාලන බලය ඉංගිරිසින් අතට යෑම නිසා මිස ඉංගිරිසි භාෂාවේ ඇති සුවිශේෂ ගුණයක් නිසා නොවේ. යම් අයුරකින් ස්පාඤ්ඤයන් ලෝක ආධිපත්‍යයට පැමිණියේ නම් අද බටහිර විද්‍යාවේ භාවිතා කරන නිල භාෂාව ස්පාඤ්ඤ භාෂාව වීමට තිබුණි. ඒ එසේ වී නම් මෙරට තකතීරු පණ්ඩිතයන් ස්පාඤ්ඤ භාෂාව බටහිර විද්‍යාව ප්‍රකාශ කිරීමට කෙතරම් සුදුසු බසක් ද යන්න ගැන බෙරිහන් දීමට තිබුණි. මෙයින් අදහස් කරන්නේ ඉංගිරිසි බස ඉගෙන නොගත යුතු බව නොවේ. බටහිර නූතනත්වයට අභියෝග කිරීමට ඉංගිරිසි බස යොදා ගත නොහැකි බවත් එහි දී සිංහල, දෙමළ, හින්දි ආදී අනෙක් භාෂාවලින් වැඩ කිරීම ඉතා වැදගත් බවත් මෙයින් කියැවෙයි. අද ලෝක ප්‍රවනතාවක් ලෙස ඉංගිරිසියෙන් නවකතා ලිවීමට විශාල අනුබලයක් බ්‍රිතානි කවුන්සලය ආදී බ්‍රිතානි ආයතන ලබා දෙනු දැකගත හැකි ය. මෙහි පසුබිමේ ඇත්තේ ඉංගිරිසි නොවන භාෂාවලින් ලිවීම පසු බැස්සවීම බවත් එමගින් ඉංගිරිසි ආධිපත්‍යය තවදුරටත් පවත්වා ගෙන යෑම බවත් ලංකාවේ ද ඉංගිරිසි නවකතා සඳහා ග්‍රේෂන් වැනි ත්‍යාග පිරිනමන අය නොදන්නවා විය හැකි ය. යම් අයුරකින් ෂේක්ස්පියර පඬිවරයාට ලතින් බසින් ලිවීමට අනුබල දෙන ව්‍යාපාරයක් තිබිණි නම් අද මෙරට බොරු පණ්ඩිතයන්ට ඉංගිරිසි සාහිත්‍යයක් ගැන කතා කිරීමට එතරම් දෙයක් ඉතිරි වන්නට නොතිබිණි.

© Prof. Nalin De Silva

ඉංගිරිසි බස යුරෝපීය භාෂා අතර ප්‍රධානත්වයට ඉබේට පත් වුවා නොවේ. එයට ජර්මන් හා විශේෂයෙන් ම ප්‍රංශ භාෂාව සමග තරග වැදීමට සිදු විය. ප්‍රංශයන් අධිරාජ්‍යයක් ගොඩනගාගෙන කලා කෘතීන් ගැන විශේෂ අවධානයක් යොමු කරමින් විශේෂ කලා මංකොල්ලයක යෙදුණු විට ප්‍රංශ භාෂාවට සාහිත්‍ය කලාවන්හි ප්‍රමුඛස්ථානයක් හිමි විය. අද ඉංගිරිසින් බුකර් හා වෙනත් තෑගි ප්‍රදානය කිරීමෙන්, සාහිත්‍යයෙහි ඉංගිරිසි බස උසස් තැනකට ගෙන ඒමටත්, ලෝකයේ අනෙක් භාෂා දුර්වල කිරීමටත්, තම සංස්කෘතියෙහි අඩුපාඩුකම් මකාගන්නා අතර අනෙක් රටවල සංස්කෘතීන්ට පහර ගැසීමටත් කටයුතු කරනු පෙනෙයි. මේ තෑගි එකක්වත් හුදු සාහිත්‍ය තෑගි නොවන බවත් එහි දේශපාලනයක් ඇති බවත් අමතක නොකළ යුතු ය.

බටහිර නූතනත්වය යනු අන් කිසිවක් නොව චින්තන විප්ලවයකි. මේ චින්තන විප්ලවය පහළොස්වැනි සියවසෙහි ස්පාඤ්ඤය අවට ප්‍රදේශයෙහි ආරම්භ වී ඇති බව පැහැදිලි ය. බටහිර විද්‍යාව ද මේ චින්තන විප්ලවයෙහි ම ප්‍රතිඵලයක් මිස ඊනියා විද්‍යාත්මක විධි ක්‍රමයකින් බිහි වුවක් නොවේ. බර්ට්‍රන්ඩ් රසල් පඬිවරයා චින්තනය හෝ ජාතික චින්තනය හෝ ගැන අසා තිබුවෙක් නොවී ය. එහෙත් ඔහු ඉතා වැදගත් ප්‍රකාශයක් කර ඇත. එනම් බටහිර නූතනත්වයේ මිනිසා යුරෝපයේ මධ්‍යකාලීන මිනිසාගෙන්, සිතූ පැතූ ආකාරය සම්බන්ධයෙන් ගත්කල සම්පූර්ණයෙන් වෙනස් බව ය.  මේ වෙනස ඇති කිරීමෙහි ලා ගැලීලියෝ පඬිවරයාගෙන් වී ඇති සේවය අති මහත් ය. ඔහුට බටහිර විද්‍යාවේ පියා යැයි කියැවෙන්නේ මේ චින්තන විප්ලවය ඇති කෙරීමෙහි ලා ඔහුගෙන් සිදු වී ඇති කාර්යභාරය බටහිරයන් කිසියම් අයුරකින් හෝ තේරුම් ගෙන ඇති බැවිනි.

බටහිර භෞතික විද්‍යාවට බටහිර ගණිතය ගෙන ආවේ ගැලීලියෝ පඬිවරයා ය. ඇරිස්ටෝටලීය භෞතිකයෙහි ගණිතයක් නොවී ය. බටහිර ගණිතය වියුක්ත වූයේ ග්‍රීක අත් දැකීම් පදනම් කර ගනිමිනි. එයට යුදෙව් චින්තනය ද බල පෑවේ ය. බටහිර ගණිතයෙන් ප්‍රකාශ කළ හැකි දේ පමණක් සත්‍ය යැයි යන මතය ඇති කිරීමට ගැලීලියෝ විද්වතා පුරෝගාමී විය. වියුක්තය පමණක් සත්‍ය වේ ය, යථාර්ථය වියුක්ත වේ ය යන මතය ඒ සමග යුරෝපය පුරා පැතිරී යෑමට පටන් ගත්තේ ය. මෙය ද යුදෙව් චින්තනයෙන් ගලා ආවේ ය. යුදෙව් දෙවියන් වහන්සේ ඉතා වියුක්ත සංකල්පයක් විය. මනසින් හෝ නිර්මාණය කර ගත හැකි රූපකායක් නැති වියුක්ත දෙවියන් වහන්සේ සත්‍ය යැයි සැලකීමට යුදෙව්වෝ පුරුදු වී සිටියහ. ගැලීලියෝ පඬිවරයා සෙසු යුරෝපීයයන්ට හඳුන්වා දුන්නේ මේ චින්තනය ය.

මේ වන විට ආරම්භ වී තිබූ රෙපරමාදු ප්‍රතිසංස්කරණයේ ද මූලික අදහස් ගැන විමසිලිමත් වූ විට පෙනී යන කරුණක් නම් එහි ද යුදෙව් චින්තනය ගැබ් වී තිබුණ බව ය. ප්‍රතිසංස්කරුවන්ගේ විරෝධය ආගමික මුහුණුවරක් ගනිමින් පාප්වහන්සේගේ ආධිපත්‍යය අභියෝගයට ලක් කළ බව සැබෑ ය. එහෙත් ඔවුන් පහර ගැසුවේ කතෝලික චින්තනයට ය. කතෝලික චින්තනයෙහි දෙවියන් වහන්සේ යම් ප්‍රමාණයකට සංයුක්ත කර තිබුණි. කතෝලිකයන්ගේ දෙවියන් වහන්සේ වියුක්ත යුදෙව් දෙවියන් වහන්සේ නොවූහ. කතෝලික දෙවියන් වහන්සේ මරිය තුමියගේ කුසින් කාහටත් මනසින් නොව මසසින් ද දැකගත හැකි අයුරින් යේසුස් වහන්සේ ලෙස ලොවට බිහි වූහ. රෙපරමාදු ප්‍රතිසංස්කරණයෙන් ඒ සියල්ල වෙනස් විය. මරිය තුමියට තිබූ ගෞරවය හා භක්තිය නැති වී ගියේ ය. දෙවියන් වහන්සේ පෞද්ගලික දෙවියන් වහන්සේ කෙනකු බවට පත් වූයේ ය. දෙවියන් වහන්සේ සෑම තැනක ම ඇති බැවින් රෙපරමාදු ප්‍රතිසංස්කරුවෝ පල්ලියට යෑමේ අවශ්‍යතාවය ප්‍රශ්න කළහ. උන්වහන්සේ හා පුද්ගලයා අතර පූජකවරයකුගේ අවශ්‍යතාවය කතෝලික ආගමෙහි මෙන් රෙපරමාදු ආගම්වල දක්නට නොහැකි ය. දෙවියන් වහන්සේ පෞද්ගලිකකරණයට ලක් කිරීමක් මෙහි දී සිදුවිණි යැයි කිව හැකි ය. සාමූහික ව අදහන දෙවියන් වහන්සේ කෙනකු වෙනුවට පෞද්ගලික ව ඇදහිය හැකි වියුක්ත දෙවියන් වහන්සේ කෙනකු රෙපරමාදු ප්‍රතිසංස්කරණය තුළින් බිහි විය. දෙවියන් වහන්සේ මිනිසාගෙන් නැවතත් වෙන් කරනු ලැබිණි. ඒ සමග ම මිනිසා ද එකිනෙකාගෙන් වෙන් කිරීම ඇරඹුණි. කතෝලික ආගම තුළ ජේසුයිට් හා ඩොමිනිකන් වැනි පූජක කුල ශක්තිමත් වූයේ එවැනි පසුබිමක් තුළ ය. ඩොමිනිකන් යන ලතින් වදනෙහි තේරුම දෙවියන් වහන්සේගේ බල්ලා යන්න ය. දෙවියන් වහන්සේ කතෝලික ආගමෙහි දැක්වෙන ස්වරූපයෙන් ආරක්ෂා කර ගැනීම මේ පූජකවරුන්ගේ අරමුණ විය.

කලින් ද සඳහන් කර ඇති පරිදි ගැලීලියෝ පඬිවරයා භක්තිමත් කතෝලිකයෙක් විය. එහෙත් ඔහු හා රෙපරමාදු ප්‍රතිසංස්කරුවන් අතර යම් සම්බන්ධකමක් විය. ඒ චින්තනය සම්බන්ධයෙනි. ගැලීලියෝ පඬිවරයාගේ විද්‍යාව පංචේන්ද්‍රියන්ගේ ඈතට යන විද්‍යාවක් විය. එය ඇතැම් විට මූලික පංචේන්ද්‍රීය අත්දැකීම්වලින් වෙන් විය. එක්

© Prof. Nalin De Silva

අතකින් ගත්කල සූර්ය කේන්ද්‍රවාදය ද පංචේන්ද්‍රිය අත්දැකීමක් නොවේ. අපට පෙනෙන්නේ සූර්යයා නැගෙනහිරින් පායා බටහිරින් බැස යැමකි. එය අපේ ඉන්ද්‍රිය ගෝචර අත්දැකීම වෙයි. පෙළොව ඉර වටා යැමක් අපට අත්දැකීමට නොහැකි ය. එහෙත් ගැලිලියෝ පඬිවරයා ඉතා තදින් පවසා සිටියේ මේ ඉන්ද්‍රිය ගෝචර නොවන අත්දැකීම පිළිගන්නා ලෙස ය. එකල සිටි යුරෝපීයයනට එය පිළිගැනීමට නෙහැකි වී නම් එය පුදුමයට කරුණක් නොවේ.

මෙහි දී කලින් සඳහන් කර ඇති තවත් කරුණක් අවධාරණය කළ යුතු ය. කොපර්නිකස්වාදය සමග කතෝලික ගැලීලියෝ පඬිවරයා එකඟ වූ නමුත් රෙපරමාදු ප්‍රතිසංස්කරණයේ නායකයකු වූ මාටින් ලූතර් පූජකවරයා එයට විරුද්ධ විය. ඔහු කොපර්නිකස්වාදය පරණ තෙස්තමේන්තුවට විරුද්ධ බව කියා සිටියේ ය. පරණ තෙස්තමේන්තුවේ සඳහන් ආකාරයට දෙවියන් වහන්සේ සූර්යයාගේ ගමන තම දේව බලයෙන් නවතා ඇත. එහෙත් පොළොවේ ගමන නැවතූ බවක් හෝ පොළොවේ ගමනක් ගැන හෝ පරණ තෙස්තමේන්තුවේ සඳහන් නොවෙයි. මෙයින් කියැවෙන්නේ ගමන් කරන්නේ සූර්යයා මිස පොළොව නොවන බව මාටින් ලූතර් පූජකවරයා කියා සිටියේ ය. චින්තන විප්ලවයක් වන කාලයක මිනිසුන් සිතන පතන ආකාරය සංගත නොවන බව මෙයින් පැහැදිලි වෙයි. කෙසේ වෙතත් බටහිර විද්‍යාව හා රෙපරමාදු ප්‍රතිසංස්කරණ එකම චින්තනයක් තුළ බිහි වූ දැ වෙයි.  බටහිර විද්‍යාවේ ආගම රෙපරමාදු ආගම යැයි කිව හැකි ය. බටහිර විද්‍යාවට කතෝලික පල්ලිය විරුද්ධ වූයේ මේ චින්තන විරෝධතාවය හේතුවෙනි. බටහිරයන් කතෝලික චින්තනයෙන් මිදී යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනයට සම්පූර්ණයෙන් මෙන් පැමිණියේ දහඅට වැනි සියවසෙහි ය. බොහෝ බටහිරයන් බටහිර නූතනත්වය දහඅට වැනි සියවසෙන් පසුව ඇති වී යැයි කියන්නේ ද එබැවිනි. එහෙත් එහි ආරම්භය පහළොස්වැනි සියවස බව අප අමතක නොකළ යුතු ය.

දහනමවැනි සියවසේ සිට අළුත් චින්තනයක් යුරෝපයේ බිහිවීමට වෙර දරා තිබෙනු අපට දැකිය හැකි ය. හෙගල් පඬිවරයාගේ න්‍යාය, මාක්ස්වාදය, ක්වොන්ටම් භෞතිකය, පරිසරවාදය, ඊනියා පශ්චාත් නූතනවාදී අදහස් මේ සමග සම්බන්ධ ය. එහෙත් ඒ නව චින්තනය බටහිර ගබ්සා වී ඇතැයි මට සිතෙයි. පශ්චාත් නූතනවාදය යනු මේ ගබ්සා වීම ප්‍රකාශ වන ආකාරය වෙයි. එසේ නව චින්තනයක් ගබ්සා වීමට ප්‍රධාන හේතුව ඊනියා යථාර්ථය නම් සංකල්පයෙන් නිදහස් වීමට බටහිරයන්ට නොහැකි වීම ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva